පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

ஆட்களை பதிவு செய்யும் திணைக்களம்

**Department for Registration of Persons**

# කාර්ය සාධන වාර්තාව-2012

# செயல் மதிப்பீட்டு அறிக்கை-2012

# PERFORMANCE REPORT-2012




සී-45, කැප්පෙටිපොල පාර, කොළඹ 05.

சி-45, கெப்பெட்டிபொல மாவத்தை, கொழும்பு-05.

C-45, Keppetipola Road, Colombo 05.

# කාර්ය සාධන වාර්තාව
# 2012

## පටුන


| | | |
|---|---|---|
| **1.** | හැඳින්වීම | **1** |
| | දැක්ම | **1** |
| | මෙහෙවර | **1** |
| | අරමුණු | **1** |
| | කාර්ය භාරය | **2** |
| **2.** | හැඳුනුම්පත් නිකුත් කිරීම | **3** |
| **3.** | ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමේ වැඩ සටහන | **6** |
| **4.** | හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය සඳහා පරිගණක හා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම | **7** |
| **5.** | ජංගම සේවය | **8** |
| **6.** | පුහුණු කිරීමේ කටයුතු | **8** |
| **7.** | දිරි දීමනා ගෙවීම | **9** |
| **8.** | නීතිමය කටයුතු | **9** |
| **9.** | භෞතික සම්පත් කළමනාකරණය | **10** |
| **11.** | මූල්‍ය ප්‍රගතිය | **11** |
| **12.** | කාර්ය මණ්ඩල විස්තර | **12** |
| **13.** | **e-NIC** ව්‍යාපෘතිය | **13** |

# පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
# කාර්ය සාධන වාර්තාව
# 2012 වසර

## 1. හැඳින්වීම

1968 අංක 32 දරණ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන අනුව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් 1972 වර්ෂයේ සිට වයස අවුරුදු 18 ඉක්මවූ ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල පදිංචිකරුවන් ලියාපදිංචි කිරීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම ආරම්භ කරන ලද අතර එම පනතට කරන ලද සංශෝධනයනට අනුව 1981 වසරේ සිට පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ වයස් සීමාව අවුරුදු 16 ලෙස නම් කරන ලදි.

### දැක්ම

පුරවැසි අනන්‍යතාව විශ්වාසනීයව තහවුරු කරන මහජන හිතකාමී සේවා සපයන්නා බවට පත්වීම

### මෙහෙවර

1968 අංක 32 දරණ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත ප්‍රකාරව
වයස අවුරුදු 16 සම්පූර්ණ කළ ශ්‍රී ලාංකික පුරවැසියන්
කාර්යක්ෂමව හා සුරක්ෂිතව ලියාපදිංචි කර හැඳුනුම්පතක් නිකුත් කිරීම

### අරමුණ

1971 අංක 28, 1971 අංක 37 හා 1981 අංක 11 දරන පනත්වලින් සංශෝධිත
1968 අංක 32 දරණ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනතට අනුව
පුද්ගලයින් ලියාපදිංචි කර හැඳුනුම්පතක් නිකුත් කිරිම
ප්‍රධාන අරමුණ කර ගත් මෙම දෙපාර්තමේන්තුව,
පුද්ගලයන් ගේ අනන්‍යතාව සහතික කරන ප්‍රධානතම ලියවිල්ල වන
ජාතික හැඳුනුම්පත නිකුත් කිරීමේ දී
21 වන සියවසේ අභියෝගවලට මුහුණදෙමින්
නිසි කළමනාකරණයක් තුළින් එම කාර්ය භාරය ඉටු කරමින්
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පවත්නා
නීතිය හා සාමය ආරක්ෂා කිරීමට උපකාරී වෙමින්
රාජ්‍ය පාලනයට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම අපේක්ෂා කෙරේ.

**කාර්ය භාරය**

- ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූලව පදිංචි වයස අවුරුදු 16 සම්පූර්ණ කළ පුද්ගලයින් ලියාපදිංචි කිරීම හා ඔවුන්ට හැඳුනුම්පත් නිකුත් කිරීම.
- දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ හැඳුනුම්පත්වල සංශෝධනයක් අවශ්‍ය වූ විට අවශ්‍ය පරිදි සංශෝධනය කර දීම.
- නැති වූ හැඳුනුම්පත් සඳහා එම හැඳුනුම්පතෙහි අනුපිටපතක් නිකුත් කිරීම.
- ඉහත සඳහන් කරන ලද සේවාවන් දිනක් තුළදී එක් දින සේවය මගින් ඉටු කරදීම.
- හැඳුනුම්පතක් නිකුත් කිරීමේ දී සිදු වන අක්‍රමිකතා සම්බන්ධව නීතිමය කටයුතු ක්‍රියාත්මක කිරීම.
- හැඳුනුම්පත පිළිබඳව හා අයදුම් කිරීමේ ක්‍රමවේදය පිළිබඳව විවිධ ආයතන දැනුවත් කිරීම.
- ආයතන හා දෙපාර්තමේන්තු මගින් කරන ඉල්ලීම් අනුව හැඳුනුම්පතෙහි තොරතුරු තහවුරු කිරීම.
- පොලිස් නිෂ්කාශන සඳහා තොරතුරු ලබාදීම.


## 2. හැඳුනුම්පත් නිකුත් කිරීම.

- **සාමාන්‍ය සේවය**

2012 වර්ෂයේ ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ සාමාන්‍ය සේවය යටතේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ හැඳුනුම්පත් ගණන පහත පරිදි වේ.

| මාසය | ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාව |
|---|---|---|
| ජනවාරි | 43027 | 66156 |
| පෙබරවාරි | 41584 | 49628 |
| මාර්තු | 46183 | 48355 |
| අප්‍රේල් | 36203 | 32490 |
| මැයි | 53257 | 36784 |
| ජුනි | 93711 | 37499 |
| ජුලි | 136142 | 47003 |
| අගෝස්තු | 72945 | 56528 |
| සැප්තැම්බර් | 63778 | 51631 |
| ඔක්තෝම්බර් | 66788 | 71270 |
| නොවැම්බර් | 54860 | 71688 |
| දෙසැම්බර් | 45739 | 66356 |
| එකතුව | 754217 | 635388 |

ඉහත වගුවේ ආකාරයට අයදුම්පත් ලැබීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම අතර වෙනස නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද හා අවලංගු කරන ලද අයදුම්පත් වේ




- **එක් දින සේවය**

හදිසි අවශතාවයන් සඳහා කඩිනමින් හැඳුනුම්පත් ලබා ගැනීමට අපේක්ෂා කරන අයදුම්කරුවන් වෙනුවෙන් එක් දිනක් තුළ හැඳුනුම්පත් නිකුත් කිරීමේ කඩිනම් වැඩපිළිවෙලක් (එක් දින සේවය) 2003.09.01 දින සිට ආරම්භ කර ඇත. මේ යටතේ එක් අයදුම්පතක් වෙනුවෙන් රුපියල් 500ක රජයේ අනුමත ගාස්තුවක් අය කරනු ලැබේ.


එක් දින සේවා වැඩ සටහන යටතේ 2012 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා එක් එක් මාසය තුළ නිකුත් කරනු ලැබූ හැඳුනුම්පත් සංඛ්‍යාව සහ ඉන් දෙපාර්තමේන්තුව ලැබූ ආදායම පහත සටහනෙන් දැක්වේ.

| මාසය | නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාව | ලද ආදායම (රු) |
|---|---:|---:|
| ජනවාරි | 11191 | 5,595,500 |
| පෙබරවාරි | 10349 | 5,174,500 |
| මාර්තු | 12598 | 6,299,000 |
| අප්‍රේල් | 7058 | 3,529,000 |
| මැයි | 10490 | 5,245,000 |
| ජුනි | 13001 | 6,500,500 |
| ජුලි | 13926 | 6,963,000 |
| අගෝස්තු | 13275 | 6,637,500 |
| සැප්තැම්බර් | 11752 | 5,876,000 |
| ඔක්තෝම්බර් | 12749 | 6,374,500 |
| නොවැම්බර් | 15705 | 7,852,500 |
| දෙසැම්බර් | 14440 | 7,220,000 |
| එකතුව | 146534 | 73,267,000 |



- **අයදුම්පත් ලැබීම හා හැඳුනුම්පත් නිකුත් කිරීම**

| වර්ෂය | ලද අයදුම්පත් සංඛ්‍යාව | නිකුත් කළ හැඳුන්ම්පත් සංඛ්‍යාව | වර්ෂය | ලද අයදුම්පත් සංඛ්‍යාව | නිකුත් කළ හැදනුම්පත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1972 | 1,305,801 | 22,459 | 1993 | 528,628 | 468,494 |
| 1973 | 5,570,696 | 680,024 | 1994 | 545,121 | 493,093 |
| 1974 | 619,855 | 5,071,234 | 1995 | 907,560 | 616,915 |
| 1975 | 72,268 | 248,694 | 1996 | 816,275 | 853,191 |
| 1976 | 138,216 | 246,694 | 1997 | 782,988 | 636,187 |
| 1977 | 152,221 | 221,783 | 1998 | 771,597 | 655,580 |
| 1978 | 236,834 | 423,276 | 1999 | 731,079 | 753,560 |
| 1979 | 186,813 | 194,436 | 2000 | 758,463 | 651,787 |
| 1980 | 360,510 | 297,702 | 2001 | 711,295 | 679,250 |
| 1981 | 479,724 | 474,577 | 2002 | 794,357 | 700,000 |
| 1982 | 425,904 | 505,559 | 2003 | 633,168 | 635,046 |
| 1983 | 358,830 | 342,088 | 2004 | 607,111 | 524,241 |
| 1984 | 451,651 | 421,010 | 2005 | 731,310 | 564,872 |
| 1985 | 446,619 | 458,557 | 2006 | 1,196,276 | 897,674 |
| 1986 | 364,150 | 374,074 | 2007 | 1,086,236 | 958,445 |
| 1987 | 372,108 | 353,819 | 2008 | 933,663 | 818,407 |
| 1988 | 431,102 | 409,870 | 2009 | 986,670 | 941,537 |
| 1989 | 365,966 | 333,083 | 2010 | 899,349 | 890,084 |
| 1990 | 491,622 | 397,135 | 2011 | 752,399 | 835,548 |
| 1991 | 676,681 | 646,150 | 2012 | 900,751 | 781,922 |
| 1992 | 568,493 | 545,957 | මුලු එකතුව | **30,150,360** | **26,065,569** |



## 3. ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමේ වැඩසටහන්

- **තාවකාලික ලිපිකරුවන් (දෙමළ භාෂා) බඳවා ගැනීම**

ජාතික හැඳුනුම්පත් සැකසීම සඳහා විශේෂයෙන් බඳවා ගෙන ඇති දෙපාර්තමේන්තු සේවකයින් වන නිෂ්පාදන සහායකයන් අතුරින් දෙමළ බසින් ලිවිය යුතු හැඳුනුම්පත් සම්බන්ධයෙන් කටයුතු කිරීමට හැකි සේවකයන්ගේ හිඟය නිසා දෙමළ බසින් හැඳුනුම්පත් නිකුත් කිරීමේ පසුබෑමක් ඇති විය.

මේ සම්බන්ධව ව්‍යවස්ථා කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය වෙත සිදු කරන ලද ඉල්ලීමක් අනුව එම අමාත්‍යාංශය මගින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) ආධාර යටතේ ක්‍රියාත්මක වන "යුක්තිදාමයට සම ප්‍රවේශත්ව" ව්‍යාපෘති (Equal Access to Justice) වැඩසටහන යටතේ පුහුණුව ලැබූ 16 දෙනෙකු ආරම්භයේදී රු 9000/- ක මාසික දීමනාවක් ලබා දීමේ පදනම මත තාවකාලික ලිපිකරු (දෙමළ භාෂා) වශයෙන් බඳවා ගන්නා ලදී. එම නිලධාරීන් පහත පරිදි සේවයේ යොදවා ගන්නා ලදි. මේ සඳහා ප්‍රතිපාදන ඉහත ව්‍යාපෘතිය යටතේ ලබා දෙන ලදී.

| කාල සීමාව | ලිපිකරුවන් ගණන | ගෙවීම් පදනම |
|---|---|---|
| 2009.08.07 - 2009.11.06 | 16 | රු 9000/- ක මාසික දීමනාවක් |
| 2009.11.16 - 2010.03.15 | 16 | |
| 2010.04.15 - 2010.08.31 | 23 | රු 10000/- ක මාසික දීමනාවක් |
| 2010.09.15 - 2011.02.14 | 07 | රු 15000/- ක මාසික දීමනාවක් |
| 2010.10.04 - 2011.02.14 | 23 | |
| 2011.08.01 – 2011.12.31 | 07 | |
| 2012.01.04 – 2012.05.31 | 07 | |
| 2012.06.06 – 2012.07.31 | 07 | |
| 2012.08.01 – 2012.12.31 | 07 | |

- **සිවිල් ආරක්ෂක නිලධාරීන් සේවයේ යෙදවීම**

ජාතික හැඳුනුම්පත් සකස් කිරීමේ ක්‍රියාවලියට ඍජුව දායක වන නිශ්පාදන සහායක කාණ්ඩයේ නිළධාරීන් උසස් වීම් ලබා වෙනත් සේවා වලට යාම හේතුවෙන් හැඳුනුම්පත් සකස් කිරීම සඳහා යොදවා ගත හැකි නිලධාරීන් සීමා විය. එම නිසා සිවිල් ආරක්ෂක නිලධාරීන් 47 දෙනෙකු 2010.09.20 දින සිට මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදවා ඇත. 2012 වර්ෂයේ ජනවාර් මාසයේදී නිලධාරීන් 46 දෙනෙකු සේවයේ නියිතුව සිටි අතර පසුව එය 54 දක්වා වර්ධනය වන ලදි.

- **ප්‍රායෝගික පුහුණු සිසු සිසුවියන් බඳවා ගැනීම**

ඉහත නිලධාරීන්ට අමතරව වෘත්තීය පුහුණු ආයතන වල අධ්‍යාපනය ලත් සිසු සිසුවියන් පහත පරිදි දිනකට රු 500/= ක දීමනාවක් යටතේ සේවයට යොදවාගෙන ඇත.

| කාල සීමාව | සිසු සිසුවියන් ගණන | වෘත්තීය පුහුණු ආයතනය |
|---|---|---|
| 2011.08.10 – 2012.02.09 | 6 | ජාතික තරුණ සේවා සභාව |
| 2011.08.15 – 2012.02.14 | 4 | ලලිත් ඇතුලත්මුදලි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය |
| 2011.12.08 – 2012.06.07 | 01 | දෙහිවල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය |
| 2012.04.02 – 2012.10.01 | 4 | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය |
| 2012.04.20 – 2012.10.19 | 1 | ගම්පහ කාර්මික විද්‍යාලය |
| 2012.10.01 – 2013.03.31 | 2 | ශ්‍රී ලංකා කොරියානු ජාතික තාක්ෂණික විද්‍යාලය |

4. හැඳුනුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම

- **පරිගණක අනුසාරයෙන් අංක යෙදීම**

මුල් වරට නිකුත් කරනු ලබන හැඳුනුම්පත් සඳහා අංක යෙදීම 2007 ජනවාරි 01 වන දින සිට දෙපාර්තමේන්තුව තුළම සිදු කරන අතර 2012 ජනවාරි සිට දෙසැම්බර් මස දක්වා අංක යොදන ලද හැඳුනුම්පත් සංඛ්‍යාව පහත දැක්වේ.

| මාසය | අංක යෙදූ හැඳුනුම්පත් |
|---|---|
| ජනවාරි | 16,991 |
| පෙබරවාරි | 16,790 |
| මාර්තු | 20,121 |
| අප්‍රේල් | 14,587 |
| මැයි | 19,944 |
| ජුනි | 28,360 |
| ජුලි | 39,922 |
| අගෝස්තු | 55,301 |
| සැප්තැම්බර් | 56,151 |
| ඔක්තෝම්බර් | 56,951 |
| නොවැම්බර් | 53,727 |
| දෙසැම්බර් | 19,393 |
| එකතුව | 398,238 |

- **පරිගණක සුවිපත් නිකුත් කිරීම**

නැතිවූ හැඳුනුම්පත් සඳහා අනුපිටපත් නිකුත් කිරීමේ දී සහ පවත්නා හැඳුනුම්පත් සංශෝධනය කිරිමේදී අවශ්‍ය වන දෙපාර්තමේන්තු වාර්තා (සුවිපත්) සෙවීම අතින් සිදු කෙරෙන කාර්යයක් විය. දැනට එම සුවි පත් පරිගණක ගත කර ඇති බැවින් ඒවා පරිගණකය මගින් පරීක්ෂා කිරීම සිදු වේ.

## 5. ජංගම සේවය

ඡන්ද ප්‍රකාශ කිරීම සඳහා ජාතික හැඳුනුම්පත අනිවාර්ය කිරීමත් සමග ජංගම සේවා පැවැත්වීම වේගවත් කරන ලදි. මෙම ජංගම සේවා මගින් දුර බැහැර ප්‍රදේශ වල සිටින ජනතාව වෙත ගොස් සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාර ගැනීම සිදු කරනු ලබයි. ස්ථානීය මට්ටමින් ක්‍රියාත්මක කරන ලද ජංගම සේවා වැඩසටහන් යටතේ 2012 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා අයදුම්පත් 28,582 ක් ලැබී ඇත.

## 6. පුහුණු කිරීමේ කටයුතු

මෙම දෙපාර්තමේන්තුවේ සිංහල නිලධාරීන් සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ උපදේශක මහත්මියක් මගින් දෙමළ භාෂාව පිළිබඳ පුහුණුවීම් කටයුතු ආරම්භ කරන ලදි. ඊට අමතරව නිලධාරින්ගේ ඵලදායීතාවය වර්ධනය කිරීමේ අරමුනින් පුහුණු පාඨමාලා 4 ක් දෙපාර්තමේන්තු පරිශ්‍රය තුල පවත්වන ලදි.

රාජ්‍ය සේවා පුහුණු ආයතනය මගින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා 2012 වර්ෂයේ සහභාගී වූ සංඛ්‍යාව 298 කි.

දෙපාර්තමේන්තුවේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කරවා ගැනීම හා මහජනතාවට කඩිනමින් සේවයක් ලබා දීම සඳහා මෙම පුහුණුවීම් තුළින් අපේක්ෂා කෙරේ.

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පුහුණු කිරීම පහත වගු මගින් වක්වා ඇත.

- **දෙපාර්තමේන්තු පරිශ්‍රය තුල පැවැත්වූ පුහුණු**

| අනු අංකය | පවත්වන ලද පුහුණු වැඩසටහන | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| 1. | යහපත් මහජන සම්බන්ධතාවයක් පවත්වා ගැනිම | 100 |
| 2. | චිත්තවේග පාලනය සහිතව වැඩ කිරීම පිළිබඳ පුහුණුව | 105 |
| 3. | පෞරුෂ වර්ධනය පිළිබඳ පුහුණුව | 100 |
| 4. | මූලික ඵලදායිතා සංකල්ප හඳුන්වාදීම පිළිබඳ පුහුණුව | 200 |
| 5. | දෙමළ භාෂා පුහුණු පාඨමාලාව (මාස 9) | 125 |

- **රාජ්‍ය සේවා පුහුණු ආයතනය මගින් පවත්වූ පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම්**

| අනු අංකය | පවත්වන ලද පුහුණු වැඩසටහන | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| 1. | උසස් පරිගණක පුහුණුව | 30 |
| 2. | සේවාරම්භක පුහුණුව | 54 |
| 3. | විශ්‍රාම වැටුප් කටයුතු | 8 |
| 4. | මූලික පරිගණක පුහුණුව | 135 |
| 5. | කාර්යාල කළමනාකරණය | 14 |
| 6. | පෞද්ගලික ලිපි ගොනු පවත්වා ගැනීම | 9 |
| 7. | ඵලදායීතාවය හා රාජ්‍ය සේවයේ ගුණාත්මකභාවය වර්ධනය | 11 |
| 8. | ගබඩාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 3 |
| 9. | සේවයට බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය | 3 |
| 10. | ව්‍යාපෘති කළමනාකරණය | 1 |
| 11. | රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | 13 |
| 12. | රජයේ විගණන කටයුතු | 5 |
| 13. | විනය කටයුතු ක්‍රියාපටිපාටිය | 6 |
| 14. | රා.ක.ස.සේ. අධි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පුහුණුව | 1 |
| 15. | කා.කා.ස.සේ. කාර්ය අභිවර්ධනය | 3 |
| 16. | සරප් රාජකාරී | 1 |
| 17. | වැටුප් පරිවර්ථනය පිලිබඳ පුහුණුව | 1 |

## 7. දිරි දීමනා ගෙවීම්

2003 වර්ෂයේ සිට අයදුම්කරුවන්ගේ ඉල්ලීම් මත එක් දිනක් තුලදී හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා එක් දින සේවය ආරම්භ කර ඇත.

මෙම එක් දින සේවා කාර්යමණ්ඩලය සඳහා විධිමත් අනුමැතිය සහිතව දිරි දීමනා ක්‍රමයක් ක්‍රියාත්මක වේ. 2012 වර්ෂය තුළදීද මෙම දිරි දීමනා ක්‍රමය ක්‍රියාත්මක කර ඇත.

## 8. නීතිමය කටයුතු

ගැටළු සහිත අයදුම්පත් ඉදිරිපත් කිරීම, සැක සහිත අයදුම්පත් අංක තහවුරු කිරීම, විවිධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන මගින් කරන ලද විමසීම් වලට පිළිතුරු සැපයීම, සැක කටයුතු උප්පැන්න පරීක්ෂා කිරීම සහ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත උල්ලංඝනය කිරීම් වලට දඩ අය කිරීම ආදී වශයෙන් 2012 වසර තුළ ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ විස්තර ඇමුණුම් අංක (I) හි සඳහන් වේ.

## 9. භෞතික සම්පත් කළමනාකරණය

- **ඉඩම් හා ගොඩනැගිලි**

අංක 45, කැප්පෙටිපොල පාර, කොළඹ 05 දරණ ස්ථානයෙහි පිහිටි ගොඩනැගිල්ල දෙපාර්තමේන්තුව සතුය.
වර්ෂය තුළ නව එක් දින සේවා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් කරන ලදි.

- **කුළියට ගැනීම්**

දෙපාර්තමේන්තුව අයදුම්පත් ගබඩා කිරීම සඳහා නුගේගොඩ පිහිටි වර්ග අඩි 12,180ක වපසරියකින් යුත් "යමුනා ගොඩනැගිල්ල", සියලු බදු මුදල් සහිතව රු.532,000/-ක මාසික කුළියට ලබා ගෙන ඇත.

- **අනෙකුත් වත්කම්**

දැනට දෙපාර්තමේන්තුව සතුව ඇති වාහන පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අංකය | වාහනය | මිලදී ගත් දිනය | මිල දී ගත් වටිනාකම (රු) |
|---|---|---|---|
| 202 – 9519 | ත්‍රී රෝද රථය | 1997.02.06 | 133465.00 |
| NA 2147 | L 300 වෑන් රථය | 2006.05.24 | 4450000.00 |
| KB 8577 | මෝටර් රථය | 2006.05.25 | 3400000.00 |
| PA 9855 | L 300 වෑන් රථය | 2006.11.22 | 4250000.00 |
| KF 6282 | මෝටර් රථය | 2007.12.17 | 1935000.00 |
| PB 6775 | L 300 වෑන් රථය | 2008.08.26 | 6250000.00 |
| KH 3686 | මෝටර් රථය | 2008.09.02 | 3750000.00 |
| PC 3265 | කැබ් රථය | 2011.06.28 | 2627353.00 |
| KP 5832 | ජීප් රථය | 2011.08.18 | 4587528.00 |
| WP 6059 | යතුරු පැදිය | 2011.06.14 | 104496.00 |
| PE 1266 | කැබ් රථය | 2012.06.12 | 7500000.00 |

## 10.මූල්‍ය ප්‍රගතිය

2012 වර්ෂය සඳහා වියදම් ඇස්තමේන්තුව හා වියදම් පහත පරිදි වේ.

- **දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තු හා වියදම්**

| අංකය | ක්‍රියාකාරකම් | වියදම් ඇස්තමේන්තු (රු. දහස්) | ප්‍රගතිය (රු. දහස්) | | % |
|---|---|---|---|---|---|
| 1. | පුද්ගල පඩිනඩි | 158,470 | මූල්‍ය | 136,460 | 86% |
| | | | භෞතික | | |
| 2. | අනෙකුත් පුනරාවර්ථන වියදම් | 46,070 | මූල්‍ය | 38,752 | 84% |
| | | | භෞතික | | |
| 3. | ප්‍රාග්ධන වියදම් | 47,050 | මූල්‍ය | 42,521 | 90% |
| | | | භෞතික | | |

- **විද්‍යුත් හැදුණුම්පත් ව්‍යාපෘතිය**

| අංකය | ක්‍රියාකාරකම් | වියදම් ඇස්තමේන්තු (රු. දහස්) | ප්‍රගතිය (රු. දහස්) | | % |
|---|---|---|---|---|---|
| 1. | විද්‍යුත් හැදුණුම්පත් ව්‍යාපෘතිය | 1,250,000, | මූල්‍ය | 65,337 | 5% |
| | | | භෞතික | | |

ප්‍රාග්ධන වියදම් අතරින් හැදුනුම්පත් නිෂ්පාදනයට අවශ්‍ය ආස්තර රෝල් මිලට ගැනීමට රු. මිලි 22ක් හා ආරක්ෂිත හිස් කාඩ්පත් ආනයනය කිරිම සඳහා රු.මිලි.9.4 ක් වැයකර ඇත.

2012.12.31 දිනට එක්දින සේවා ආදායම රු.73,267,000/- ක් වන අතර ඒ යටතේ නිකුත් කර ඇති හැදුනුම්පත් සංඛ්‍යාව 146,534 කි.

2012 ආදායම් හා විසර්ජන ගිණුම් සාරාංශ ඇමුණුම් අංක (II) හි දැක්වේ.

## 11.කාර්ය මණ්ඩල තොරතුරු

### I. විශ්‍රාම ගැන්වීම්

- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 10 දෙනෙකු
- කාර්යාල කාර්ය සහායක සේවයේ නිලධාරීන් 3 දෙනෙකු

### II. ඉල්ලා අස්වීම්

- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියේ නිලධාරියකු ඉල්ලා අස්වී ඇත.

### III. ස්ථාන මාරුවීම්

- ශ්‍රී.ලං.ප.සේ නිලධාරින් 3 දෙනෙකු
- බලාත්මක නිළධාරීන් 7 දෙනෙකු
- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ 15 දෙනෙකු
- දත්ත සටහන් කරුවන් එක් අයෙකු
- රියදුරු සේවයේ එක් අයකු
- කාර්යාල සේවක සේවයේ 5 දෙනෙකු

### IV. මුදා හැරීම්

- බලාත්මක නිළධාරීන් එක් අයකු
- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ 5 දෙනෙකු

### V. උසස් වීම්

- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II පන්තියේ නිලධාරීන් එක් අයකු රා.ක.ස.සේ. I පන්තියට උසස්වීම් ලබා ඇත.

- රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III පන්තියේ නිලධාරීන් එක් අයකු රා.ක.ස.සේ. II පන්තියට උසස්වීම් ලබා ඇත.

දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල විස්තරය ඇමුණුම III හි අමුණා ඇත.

## 12. e-NIC ව්‍යාපෘතිය

### 1. හැඳින්වීම

2011 අගෝස්තු 17 දින අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරිම සඳහා වූ ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම සඳහා අනුමැතිය ලැබිනි. ඒ අනුව ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ජීව දත්ත ඇතුලත් තොරතුරු පද්ධතියක් සකස් කිරීමත් එමඟින් විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරිමටත් තීරණය කරණ ලදී. උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම ව්‍යාපෘතියේ කළමණාකාරීත්වය ලංකා ලොජිස්ටික්ස් හා ටෙක්නොලොජීස් ආයතනයට පවරන ලදී. මේ වන විට ලංකා ලොජිස්ටික්ස් සහා ටෙක්නොලොජීස් ආයතනය, ජාතික පුරවැසි දත්ත පද්ධතිය (NPR) සකස් කිරීමට සේවා සපයන්නෙකු තොරාගැනීමට හා මිනිස් ශ්‍රමය උපයෝගී කරගෙන රැස් කරන ලද දත්ත, පරිගණක ගත ක්‍රියාවලියකට යොමු කිරීමට අවශ්‍ය කාර්යයෙහි නිරතව සිටී.

උක්ත අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ව්‍යාපෘති සම්බන්ධිකරණ ඒකකයක් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ පිහිටුවීම සඳහා අනුමැතිය ලබාදී තිබුනි. ඒ අනුව උක්ත ඒකකයේ ඉදිකිරිම් කටයුතු 2012 ජූලි මස ආරම්භ කෙරිනි. ව්‍යාපෘති සම්බන්ධිකරණ ඒකකය ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂක වරයෙකු තෝරා පත්කරගත් අතර පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කිහිප දෙනෙකු තාවකාලිකව නිදහස් කරගන්නා ලදී. ව්‍යාපෘතියේ අනුමත මූලික කාර්ය මණ්ඩලය සඳහා බලාත්මක නිලධාරීන් 04 දෙනෙකු හා කළමනාකරණ සහකාර 02 දෙනෙකු පත් කර ගන්නා ලදී. මේ සඳහා දීර්ඝ කාලයක් ගත වූ අතර මෙම කාර්යය සම්පූර්ණ කරගත හැකිවූයේ 2012 නොවැම්බර් මස මැද භාගයේදීය.

2012.10.14 දින පැවැත් වූ ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන රුස්වීමේ දී ව්‍යාපෘති කාර්යයන් කඩිනම් කිරිම සඳහා ලංකා ලොජිස්ටික්ස් හා ටෙක්නොලොජීස් ආයතනය ව්‍යාපෘති උපදේශක සේවා සපයන ආයතනය වශයෙන් කටයුතු කිරීමටත්, ව්‍යාපෘති සම්බන්ධිකරණ ඒකකය ව්‍යාපෘති කළමණාකරන ඒකකය ලෙස වගකීම් පැවරීමටත් තිරණය විය. මේ සඳහා 2011.08.17 අමාත්‍ය මණ්ඩල තීරණයට සංශෝධනයක් එකතු කිරීමට ද තිරණය විය.

2012.12.10 වන දින පැවති ජනාධිපති උපදේශක කමිටු රැස්වීමේ දී ව්‍යාපෘතියේ කාර්යය වේගවත් කිරීම සඳහා ව්‍යාපෘතිය අදියර දෙකක් යටතේ සිදුකිරීමට යෝජනා විය. එනම්,

1. මිනිස් ශ්‍රමය යොදා රැස් කරගන්නා ලද ශ්‍රී ලාංකික පුරවැසියන් ගේ පුද්ගල දත්ත හා ජීව දත්ත පරිගණක ආශ්‍රිත ක්‍රියාවලියකට යොමුකිරීම

2. ජාතික පුරවැසි දත්ත පද්ධතිය (NPR) සකස් කිරීම

### 2. ව්‍යාපෘතියේ ප්‍රගතිය

#### *2.1 ව්‍යාපෘති කාර්යය මණ්ඩලය බඳවා ගැනීම*

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරගන්නා ලද කාර්යය මණ්ඩලයට අනුව ව්‍යාපෘතිය සඳහා නිලධාරීන් බඳවා ගැනිම 2012 වර්ෂයේ අවසන් මාස 06 තුල දී සිදුවූ අතර 2012.12.31 දින වන විට බඳවා ගැනීම සම්බන්ධ වාර්තාව පහත දැක්වේ.

| අනුමත තනතුර | අනුමත ප්‍රමාණය | බඳවා ගන්නා ලද දිනය | වෙනත් |
|---|---|---|---|
| ව්‍යාපෘති අධ්‍යක්ෂ | 01 | 10-07-2012 | |
| තොරතුරු තාක්ෂණ පද්ධති පාලක | 01 | - | දෙපාර්තමේන්තු සහකාර අධ්‍යක්ෂක (තොරතුරු තාක්ෂණ) විසින් රාජකාරීය ආවරණය කිරීම සිදුකරනු ලබයි. |
| ව්‍යාපෘති ගණකාධිකාරී | 01 | 15-7-2012 | දෙපාර්තමේන්තු ප්‍රධාන ගණකාධිකාරී තාවකාලික පදනම මත අනුයුක්ත කර ඇත. |
| ප්‍රසම්පාදක විශේෂඥ | 01 | - | ප්‍රසම්පාදක විශේෂඥ තනතුර සඳහා දෙසැම්බර් මස පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් පැමිණ සිටියේ නැත. එම නිසා 2012 දෙසැම්බර් මස අවසානය දක්වා එම සේවය බස්නාහිර පළාත් ප්‍රධාන ඉංජිනේරුවරයාගෙන් ලබා ගන්නා ලදී. |
| ඇගයීම් නියාමන හා වාර්තාකරන නිලධාරී | 01 | - | තෝරාගන්නා ලද නිලධාරීයා සේවයට වාර්තා කර නැත. |
| කාර්මික නිලධාරී | 02 | 05.10. 2012 හා 01.01 2013 | එක් නිලධාරියෙකු 2012.10.15 ද අනෙක් නිලධාරියා 2013.01.01 දින සිට සේවයට වාර්තා කරන ලදී |
| ව්‍යාපෘති සහකාර | 04 | අගෝස්තු සහ සැප්තැම්බර්.2012 | තෝරා ගන්නා ලද බලාත්මක නිලධාරීන් අගෝස්තු හා සැප්තැම්බර් මාස දක්වා තාවකාලිකව සේවය කළ අතර 2012අගෝස්තු,සැප්තැම්බර් මාසවල ඔවුන් පූර්ණ කාලීනව නිසි ලෙස ව්‍යාපෘති කාර්යයන් සඳහා නිදහස් කරන ලදී. |
| කළමනාකරණ සහකාර | 04 | 01.10. 2012 | නිලධාරීන් 03 දෙනෙකු පූ.ලි.දෙ. මඟින් තෝරාගත් අතර ඔවුන්ගෙන් 02කු පමණක් සේවයට වාර්තා කරන ලදී. |
| කාර්යාල කාර්යය සහයක | 02 | නොවැම්බර් 2012 | බඳවා ගෙන ඇත. |
| රියදුරු | 03 | නොවැම්බර් 2012 | බඳවාගෙන ඇත. |

කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය අනුව ව්‍යාපෘති කාර්යයන් සිදු කරලීම හා ජාතික පුරවැසි දත්ත පද්ධතිය(NPR) ක්‍රියාත්මක කරලීම උදෙසා, උපාධිධාරී අභ්‍යාසලාභීන් 800ක් ප්‍රධාන කාර්යාලයට හා ප්‍රාදේශීය කාර්යාල සඳහා බඳවා ගැනීමට දිස්ත්‍රික්ක මට්ටමින් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතව තිබූ අතර 2013 පෙබරවාරි මස අවසන් භාගය වන විට බඳවා ගැනීමේ කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුනි.

### *2.2 ප්‍රධාන කාර්යාලයේ නවීකරණ කටයුතු සිදුකිරීම.*

විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘති ක්‍රියාත්මක කරලීමට සමගාමීව ප්‍රධාන කාර්යාලයේ නවීකරණ කටයුතු සිදුකරලීම හා අදාල කාර්යාලීය උපකරණ 2012 දෙවන කාර්තුවේ දී පහත සඳහන් පරිදි මිලදී ගන්නා ලදී.

**2.2.1** ලීබඩු උපකරණ :
රුපියල් මිලියන 3.3ක් වටිනා කාර්යාලීය ලී බඩු උපකරණ මිල දී ගන්නා ලදී.

**2.2.2** රුපියල් මිලියන 12 ක් වටිනා පරිගණක යන්ත්‍ර හා මුද්‍රණ යන්ත්‍ර මිල දී ගන්නා ලදී.

**2.2.3** රුපියල් මිලියන 1.6ක් වැය කොට පරිගණක අංශයේ නවීකරණ කටයුතු හා බෙදා වෙන්කිරීම් කටයුතු සිදුකරන ලදී.

### *2.3 ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ඉදිකිරීම හා අවශ්‍ය උපකරණ ලබා ගැනීම:*

රුපියල් මිලියන 3.7ක් වැයකොට දෙපාර්තමේන්තුවේ සීමිත ඉඩ ප්‍රමාණයක ව්‍යාපෘති කාර්යාලය ස්ථාපිත කරන ලදී.

### *2.4 පු.ලි.දෙ.පළාත් කාර්යාල පිහිටුවීම:*

ප්‍රාදේශීය කාර්යාලයන්හි නවීකරණ කටයුතු හා එහි කාර්යාලීය කටයුතු ක්‍රියාත්මක කිරීම පහසු කිරීම සඳහාත් ප්‍රාදේශීය කාර්යාලයන් හි කටයුතු අධීක්ෂණය කිරීම සඳහාත් දිස්ත්‍රික් හා පළාත් කාර්යාල පිහිටුවීමට නියමිත අතර උතුරු පළාත් කාර්යාලය වව්නියා දිස්ත්‍රික්කයේත් නැගෙනහිර පළාත් කාර්යාලය මඩකළපුව දිස්ත්‍රික්කයේත් පිහිටුවීම ආරම්භ වූ අතර එහි වැඩකටයුතු අවසන් වෙමින් පවති.

### *2.5 ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හි පු.ලි.දෙ. ශාඛා කාර්යාල පිහිටුවීම:*

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හි පු.ලි.දෙ. ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම අවුරුදු 04-05කට පෙර ආරම්භ වූ අතර 2010 වසර අවසන් වන විට ප්‍රාදේශීය කාර්යාල 311 ක ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුනි. නැවත ව්‍යාපෘතිය ආරම්භ වීමත් සමඟ ව්‍යාපෘතියට ගැලපෙන අයුරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 332 හි පිහිටුවා ඇති ප්‍රාදේශීය කාර්යාලවල නවීකරණ කටයුතු ආරම්භ කර ඇත.

*2.6 මූල්‍ය ප්‍රගතිය*

රුපියල් මිලියන 1200ක මුදලක් 2012 වර්ෂයේ ව්‍යාපෘති කටයුතු සඳහා වෙන්කොට පැවතිය ද 2012 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය වියදම රුපියල් මිලියන 44.9 කි මූල්‍ය වියදම පිළිබඳ සාරාංශ වාර්තාව පහතින් දැක්වේ.

ප්‍රාග්ධන වියදම් - රුපියල් 41,022,493
පුනරාවර්තන වියදම් - රුපියල් 3,887,025

මිලියන 1200ක ප්‍රතිපාදන වෙන්වී තිබියදීත් මෙපමණ අඩු වියදමක් දැරීම හේතුවූයේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා සේවා සපයන්නකු තෝරා ගැනීමට ප්‍රමාදවීමයි.

**3.** ගැටලු **:**

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවිය හැකි ගැටළු පහත සඳහන් පරිදි හඳුනාගත හැකිවිය.

අ. ලංකා ලොජිස්ටික් සහ ටෙක්නොලොජිස්ට් ආයතනය හා දෙපාර්තමේනතුව විසින් ඉටුකළයුතු වගකීම් හා කාර්ය භාරය හඳුනාගැනීම, ලංකා ලොජිස්ටික් සහ ටෙක්නොලොජිස්ට් ආයතනයට ගෙවීම් කිරීමේ ක්‍රමවේදය නිශ්චයකර ගත නොහැකිවීම නිසා දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම ප්‍රමාද විය.

ආ. සේවා සපයන්නකු තෝරා ගැනීම ප්‍රමාද වීම.


ඇ. දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පිහිටුවා ඇති ව්‍යාපෘති ඒකකයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම.

ඇ. ව්‍යාපෘතියේ ක්‍රියාත්මක අවදියේදී දෙපාර්තමේන්තුව වෙනුවෙන් ඉදිකරණ බත්තරමුල්ල ගොඩනැගිල්ලට මාරුවීමට ඇති බැවින් ව්‍යාපෘතියට අදාල නවීකරණයන් දැනට පවතින ගොඩනැගිල්ලේ සිදු කිරීම අපහසු වීම.

ඉ. 2013 වසරේදී දත්ත රැස්කිරීම අවසන් කිරීමට සැලසුම් කර ඇති බැවින් මේ වසර සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 470ක ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවේ.

## නීති මය කටයුතු - 2012 වර්ෂය

| මාසය | පොලිස් නිෂ්කාශන | නිකුත් කරන ලද ලිපි සංඛ්‍යාව |
|---|---|---|
| ජනවාරි | | |
| පෙබරවාරි | 1665 | |
| මාර්තු | 1684 | 525 |
| අප්‍රේල් | 1428 | 286 |
| මැයි | 1903 | 462 |
| ජුනි | 1703 | 751 |
| ජුලි | 1678 | 909 |
| අගෝස්තු | 1572 | 817 |
| සැප්තැම්බර් | 1491 | 822 |
| ඔක්තෝම්බර් | 1855 | 876 |
| නොවැම්බර් | 1886 | 725 |
| දෙසැම්බර් | 1605 | 570 |
| එකතුව | 18470 | 6743 |



ඇමුණුම II

ඩී.පී.එස්.ඒ - I

# විසර්ජන ගිණුම 2012

වියදම් ශීර්ෂ අංකය: 227 දෙපාර්තමේන්තුවේ නම :පුද්ගලයින් ලියාපදිංචිකිරීමේ දෙපාර්තමේන්තුව

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු.රෙ. 66 සහ 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ (අතිරික්තය) (4-5) | සිටු අංකය (අදාල ඩී.ඒ.එස්.ඒ 2 අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | පුනරාවර්තන<br>මෙහෙයුම් වැඩසටහන | 203,440,000 | 1,100,000 | 4750000/-4750000 | 204,540,000 | 175,212,890 | 29,327,110 | 2 |
| | **උප එකතුව (පුනරාවර්තන)** | **203,440,000** | **1,100,000** | **4750000/-4750000** | **204,540,000** | **175,212,890** | **29,327,110** | |
| 1 | මූලධන<br>**මෙහෙයුම් වැඩසටහන** | 32,050,000 | 15,000,000 | | 47,050,000 | 42,520,951 | 4,529,049 | 2 |
| | **උප එකතුව (මූලධන)** | **32,050,000** | **15,000,000** | **0** | **47,050,000** | **42,520,951** | **4,529,049** | |
| | පුනරාවර්තන එකතුව | 203,440,000 | 1,100,000 | 4750000/-4750000 | 204,540,000 | 175,212,890 | 29,327,110 | |
| | මූලධන එකතුව | 32,050,000 | 15,000,000 | 0 | 47,050,000 | 42,520,951 | 4,529,049 | |
| | මුළු එකතුව | **235,490,000** | **16,100,000** | **4750000/-4750000** | **251,590,000** | **217,733,841** | **33,856,159** | |

පිටු අංක 02 සිට 18 දක්වා ඩී.ඒ.එස්.ඒ 02 සිට ඩී.ඒ.එස්.ඒ 10 දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් අංක i සිට iv දා ඇතුලත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර් ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් තොරතුරු හා සටහන් වලට අනුකූලව පිලියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් සැසදීම් කර ඇති බවත්,ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණනදීමේ නිලධාරි:<br>නම:<br>තනතුර:<br>දිනය : 28/03/2013<br>ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී, පීඑස්සී<br>ලේකම්<br>රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

ගණන්දීමේ නිලධාරි<br>නම :<br>තනතුර :<br>දිනය :<br>ආර්. එම්. එස්. සරත් කුමාර<br>කොමසාරිස් ජනරාල්<br>පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව<br>අංක සී-45, කැප්පෙටිපොල පාර<br>කොළඹ-05.

ප්‍රධාන ගණකාධිකාරි<br>නම :<br>දිනය :<br>පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ<br>කොමසාරිස් ජනරාල් වෙනුවට.

DGSA-Revenue-1

## 2012 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආදායම් ගිණුම් සාරාංශය

## 2012டிசெம்பர் 31 இல் முடிவடைந்த ஆண்டிற்கான இலங்கை சனநாயக சோசலிசக் குடியரசு அரசாங்கத்தின் அரசிறைக் கணக்குகளின் பொழிப்பு

## Summary of the Revenue Accounts for the Government of the Democratic Socialist Republic of Sri Lanka for the year ended 31st December 2012

Revenue Accounting Officer : Commissioner General of Registration of Persons

Expenditure Head No. 227

| Revenue code | Description of Revenue Code | Original Revenue Estimate 2012 | Revised Revenue Estimate 2012 | Total Net Revenue Collected (Gross Revenue less Revenue Refunds) 2012 | Total Net Revenue Collected (Gross Revenue less Revenue Refunds) 2011 |
|---|---|---|---|---|---|
| | | Rs. | Rs. | Rs. | Rs. |
| 20.03.02.03 | Fees under Registration of Persons Act no 32 1968 | 69,200,000.00 | - | 83,760,894.00 | 90,640,027.00 |
| | Total | 69,200,000.00 | | 83,760,894.00 | 90,640,027.00 |

Certify that the figures appear in this Summary Statement are in agreement with the figures in the Books of Account maintained and all these figures have been reconciled with the figures in the Treasury Books of Account.

Date: 2013/03/22

Signature and Name of Chief Accountant/Head of Finance

Signature, Name and Designation of Revenue Accounting Officer

ඇමුණුම් III

**කාර්ය මණ්ඩල විස්තර - 2012**
**සේවක සංඛ්‍යා පිළිබඳ විස්තර වාර්තාව (කාර්ය මණ්ඩලය)**

| තනතුරු නාමය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්තය |
|---|---|---|---|---|
| කොමසාරිස් ජනරාල් | 1 | 1 | - | - |
| කොමසාරිස් | 2 | 2 | - | - |
| ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | - | - |
| නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් | 12 | 9 | 3 | - |
| නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ | 1 | 1 (වැ.බැ.) | 1 | - |
| ගණකාධිකාරී | 1 | 1 | - | - |
| අභ්‍යන්තර විගණක | 1 | - | 1 | - |
| පරිපාලන නිලධාරී | 2 | 1 | 1 | - |
| භාෂා පරිවර්තක | 2 | - | 2 | - |
| අයවැය සහකාර (ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කිරීම සඳහා) | 1 | 1 | - | - |
| බලාත්මක නිලධාරී | 75 | 70 | 5 | - |
| කළමනාකරණ සහකාර | 282 | 173 | 109 | - |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 10 | 9 | 1 | - |
| රියදුරු | 8 | 7 | 1 | - |
| කාර්යාල කාර්ය සහායක | 51 | 45 | 6 | - |
| පටලගත යන්ත්‍ර ක්‍රියාකරු | 2 | 2 | - | - |
| නිෂ්පාදන සහායක | 67 | 65 | 2 | - |
| ලේඛන සහායක | 11 | 10 | 1 | - |